# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2131/57 – 2019 ජූලි 12 වැනි සිකුරාදා – 2019.07.12

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: KDS/KGK/4/9/94/143.
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය: 13/96/VE/130.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර*:

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත්සතර හා ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟවට කෝරළේ සුළු කොට්ඨාසයේ, හිඳගල වසම (267) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හිඳගල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැන සකස් කරන ලද 2018.12.27 දිනැති මූලික පිඹුරු අංක මහ 6812 හි කැබලි අංක 01 සිට 05 දක්වා වූ ප්‍රමාණයෙන් හෙක්. 0.6150ක් වූ පහත සඳහන් ඉඩම් කැබලි.

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: මෝබ්‍රේවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: වී. ජොනතන්, මෝබ්‍රේ බංගලාව අසල, මහකන්ද, හිඳගල; ප්‍රමාණය: හෙක්. 0.1170.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: මෝබ්‍රේවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: මොහොමඩ් ලතීෆ්, අංක 09, අරණායක මාවත, මාවනැල්ල; ප්‍රමාණය: හෙක්. 0.3270.

03. **කැබලි අංක 03**
ඉඩමේ නම: මෝබ්‍රේවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: වී. ජොනතන්, මෝබ්‍රේ බංගලාව අසල, මහකන්ද, හිඳගල; ප්‍රමාණය: හෙක්. 0.1200.

04. **කැබලි අංක 04**
ඉඩමේ නම: –; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: වී. ජොනතන්, මෝබ්‍රේ බංගලාව අසල, මහකන්ද, හිඳගල; ප්‍රමාණය: හෙක්. 0.0130.

05. **කැබලි අංක 05**
ඉඩමේ නම: මෝබ්‍රේවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: වී. ජොනතන්, මෝබ්‍රේ බංගලාව අසල, මහකන්ද, හිඳගල; ප්‍රමාණය: හෙක්. 0.0380.


1A – G 30514 – 32 (2019/07)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 අගෝස්තු මස 26 වැනි දින පෙ.ව. 10.00ට මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2019 අගෝස්තු මස 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

බී. එම්. පී. ජේ. පී. වී. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරලේ.

2019 ජූලි මස 08 වැනි දින,
මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරලේ
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 943

## ශුද්ධි පත්‍රිකාව

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

## 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: අඹකෝ/3/5/අ/153.
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය:
4-3/2/2013/FR/557.

උක්ත ශීර්ෂය යටතේ 2019.05.06 වැනි දිනැතිව අංක 2122/03 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියෙහි දැන්වීමෙහි සඳහන් දිනයන් ඉවත්කොට ඒ වෙනුවට වෙනත් දිනයක් ආදේශ කිරීමෙන් එම දැන්වීම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *ඉවත් කළ යුතු දිනය* | *ඉවත් කළ යුතු දිනය වෙනුවට ආදේශ කළ යුතු දිනය* |
|---|---|
| 2019 ජුනි 12 | 2019 අගෝස්තු 28 |

ආර්. ටී. පී. සුමනසේකර,
ප්‍රාදේශීය ලේකම්,
අඹගමුව කෝරළය.

2019 ජූලි මස 08 වැනි දින,
අඹගමුව කෝරළය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.
07 - 944

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.